අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/09/02/01/01/020/ii

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2024.09.18

චක්‍රලේඛ අංක : 31/2024

සියලු ම රජයේ පාසල් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන් වෙත

## පාසල්වල විෂය සමගාමී කටයුතු සංවිධානය හා කළමනාකරණය

### 01. හැඳින්වීම

පාසල් තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස හඳුන්වන්නේ විෂය මාලාවට සමාන්තර ව සිසුන්ගේ කායික හා මානසික සංවර්ධනයට ඉවහල් වන්නා වූ සංවිධානාත්මක ක්‍රියාකාරකම් ය. විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින් අපේක්ෂිත අරමුණ වන්නේ යහපත් සදාචාර ගතිපැවතුම් සහිත සමාජානුයෝජනය වූ සිසු පරපුරක් බිහි කිරීම යි. විෂය සමගාමී කටයුතු මඟින් අන්‍ය අදහස් ගරු කිරීම, වගකීම් සහගත ව කටයුතු කිරීම, ඉවසීම, මිත්‍රශීලී වීම, කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නියැලීමට අවස්ථාව ලැබීම ආදී ගුණාංග නිසගව ලැබෙනු ඇත. නීති විරෝධී ක්‍රියාකාරකම්වලින් දරුවන් ඈත්වීමට ද මෙය හේතුවක් වේ. සිසුන්ට යහපත් සමාජ ක්‍රියාකාරකම්හි යෙදීමට මෙන්ම යහපත් මානසික තත්ත්වයක් සහිත ව අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට ද විෂය සමගාමී ක්‍රියාකාරකම් ඉවහල් වේ.

මේ නිසා සෑම විදුහල්පතිවරයෙකු ම පාසල තුළ සංවිධානාත්මක විෂය සමගාමී ක්‍රියාවලියක් පවත්වා ගෙන යෑම අත්‍යවශ්‍ය වේ. එක් එක් පාසලේ මානව සම්පත් සහ භෞතික සම්පත් සැලකිල්ලට ගෙන පාසල් සංස්කෘතියට ගැලපෙන පරිදි සහ උචිත විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීම පාසල සතු කාර්යයකි.

පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සක්‍රිය ව ක්‍රියාත්මක වීම සඳහා සුදුසු ක්‍රමවේද පාසල් පරිපාලනයේ මැදිහත් වීමෙන් සකසා දීම ද අත්‍යවශ්‍ය වන අතර, ඒ මඟින් පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම අර්ථ ගැන්වෙනු ඇත. එබැවින් මෙම චක්‍රලේඛයේ මතු දැක්වෙන උපදෙස් හා මගපෙන්වීම් යටතේ ඔබ පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට සහ කළමනාකරණය කිරීමට වග බලා ගත යුතු ය.

### 02. අරමුණු

I. සමබර පෞරුෂයකින් යුත් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් බිහිකිරීම.
II. ශිෂ්‍ය/ශිෂ්‍යාවන් තුළ තිබිය යුතු මෘදු කුසලතා සංවර්ධනය කිරීම.
III. රටේ තිරසාර පැවැත්ම, ජාතියේ අනාගතය, මතු අභිමානය රඳා පවතින සිසු පරපුර නිරෝගී ශරීර සෞඛ්‍යයෙන් සහ මනා පෞරුෂයකින් යුක්ත ව ගොඩනැගීම.
IV. රැකියා වෙළඳපොළට යෝග්‍ය නිපුණතා සහිත පුරවැසියන් නිර්මාණය කිරීම.
V. ශ්‍රී ලාංකේය අනන්‍යතාව සහිත ගෝලීය පුරවැසියෙකු බිහි කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் } +94112784832 +94112784825

ලේකම් / செயலாளர் } +94112784811 +94112785162

CamScanner

03. **විෂය සමගාමී වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම**

I. පාසල තුළ ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ ව විදුහල්පති ධනාත්මක ආකල්පවලින් පරිපූර්ණ විය යුතු අතර ඒ සඳහා සහභාගිවන්නන්, සංවිධායකයින්, ගුරුවරුන්, අභිප්‍රේරණය කිරීමේ වැදගත්කම මැනවින් වටහා ගත යුතු ය.
(මේ සම්බන්ධයෙන් පූර්ණ වගකීම හා වගවීම විදුහල්පති වෙත පැවරෙන අතර ගුරු සිසු සියලු දෙනාගේ ම ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය යුතු ය)

II. සියලු ම සිසුන්ගේ විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ශිෂ්‍ය වාර්තා පොතෙහි අනිවාර්යයෙන් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

III. පාසල තුළ පවත්වාගෙන යා යුතු විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රමාණය තීරණය කිරීම හා ඒවා පවත්වා ගෙන යාමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම විදුහල්පති සතු වගකීමක් වේ.

IV. සිසුන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාවක් නොවන ලෙස විෂය සමගාමී කටයුතු පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතු වේ.

V. විෂය සමගාමී ක්‍රියාකාරකම් භාරව නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරයෙකු පත් කළ යුතුය.

VI. හැකියාව හා උනන්දුව සැලකිල්ලට ගෙන පාසලේ ක්‍රියාත්මක වන එක් එක් විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ගුරුවරයෙකු පත් කර ලිඛිත ව රාජකාරී පැවරිය යුතුය.

VII. පාසල් වේලාවෙන් පසුව බාහිර පුහුණුකරුවන් යොදවා කරන පුහුණුවීම්වල දී, සෑම විටම, අදාළ විෂය සමගාමී ක්‍රියාකාරකම් භාර ගුරුවරයා සිසුන් සමඟ සහභාගි වීම අනිවාර්ය වේ.

VIII. සියලු ම විෂය සමගාමී ක්‍රියාකාරකම් විදුහල්පතිගේ/ නියෝජ්‍ය විදුහල්පතිගේ පූර්ණ නායකත්වයෙන් යුතුව නියාමනයට හා අධීක්ෂණයට ලක් කළ යුතු ය.

IX. මෙම චක්‍රලේඛය සමග හඳුන්වා දෙන උපදෙස් සංග්‍රහයේ අන්තර්ගත ක්‍රමවේද ඔස්සේ අදාළ පරිදි කමිටුව හා නිලධාරීන් පත් කළ යුතු ය.

X. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ ED/1/15/2/4/26 අංක දරන හා 2014.03.19 දිනැති 'සෑම පාසල් වාර විභාගයකදී ම ක්‍රීඩාව සඳහා ප්‍රගති වාර්තා පොතට ලකුණු ලබාදීම' මැයෙන් වන උපදෙස් ලිපියෙහි සඳහන් පරිදි, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් පාසල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහනට අනුව ආබාධිත සිසුන් හැර අනෙකුත් පාසල් සිසුන් සඳහා පාසල තුළ පවත්නා ක්‍රීඩාවක නිරත වීම අනිවාර්ය වන අතර මීට අමතරව අවම වශයෙන් තවත් විෂය සමගාමී කටයුතු දෙකකවත් නිරත විය යුතු ය.

XI. වසරක් තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති සියලු ම විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසලේ වාර්ෂික ලිතට ඇතුළත් කළ යුතු අතර, ඒ අනුව, අදාළ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

XII. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා පුහුණුකරුවන් ලෙස බාහිර පුද්ගලයින් බඳවා ගැනීමේ දී ඒ සම්බන්ධයෙන් බලාත්මක චක්‍රලේඛවලට අනුකූල ව සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් ඔස්සේ සුදුසු ම පුද්ගලයන් වෙත අවස්ථාව ලබා දිය යුතු ය.

XIII. පාසල් කාලය තුළ හා /හෝ පාසල් කාලයෙන් පසුව විෂය සමගාමී කටයුතු හා /හෝ ඕනෑම පාසල් වැඩසටහනක් සඳහා පාසලෙන් බැහැර යාමේ දී අදාළ ක්‍රියාකාරකම් පිළිබඳ වගකීම් දරන ගුරුවරයා හෝ ගුරුවරිය පුහුණුකරුට අමතර ව සහභාගි වීම අනිවාර්ය වේ.

XIV. (I) බාලිකාවන් සහභාගීවන විෂය සමගාමී කටයුතු සඳහා ගුරුවරියක සහභාගී වීම අත්‍යවශ්‍ය වේ.

(II) බාහිර ආයතන හා සංගම් මගින් ක්‍රියාත්මක කරන විදේශ සංචාර සඳහා තෝරා ගනු ලබන සිසුන් සහභාගි කරවීමේ දී අදාළ පාසලේ/ පාසල්වල ගුරුවරයෙකු/ ගුරුවරුන්ගේ සහභාගීත්වය අනිවාර්ය වේ.

CamScanner

XV. දේශීය හෝ විදේශීය පුහුණුවීම්, වැඩසටහන් හෝ ශිෂ්‍යත්ව වෙනුවෙන් සහභාගී කරවීම සඳහා සිසුන් හා ගුරුවරුන් තෝරා ගැනීමේ දී විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් ඔස්සේ සුදුසු ම සිසුන් හා ගුරුවරුන් වෙත අවස්ථාව ලබාදිය යුතු ය.

විෂය මාලාවෙන් ඔබ්බට ගොස් විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් සිසුන්ට නවමු මානයක් විවර කරලීමට මෙම චක්‍රලේඛය හා මේ සමඟ එවා ඇති උපදෙස් සංග්‍රහය අනුව කටයුතු කිරීම සියලු ම විදුහල්පතිවරුන්ගේ වගකීමක් බව අවධාරණය කරමි.

Jayasundara

ජේ. එම්. තිලකා ජයසුන්දර
ලේකම්

පිටපත් - සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - කාරුණික දැන ගැනීම සඳහා

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
ජාතික ශිෂ්‍ය භට බලකාය
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය
ශ්‍රී ලංකා රතුකුරුස සංගමය
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය
ශ්‍රී ලංකා ශාන්ත ජොන් ගිලන්රථ සේවය

} කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

# පාසල් තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම්

# ක්‍රියාත්මක කිරීම පිළිබඳ

## උපදෙස් සංග්‍රහය

(අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ED/09/02/01/01/020/ii හා 31/2024 දරන 'පාසල්වල විෂය සමගාමී කටයුතු සංවිධානය හා කළමනාකරණය' පිළිබඳ චක්‍රලේඛයට සමගාමී ව මෙම උපදෙස් සංග්‍රහය හඳුන්වා දී ඇත.)


විෂය සමගාමී, මාර්ගෝපදේශ හා උපදේශන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය


CamScanner

# පාසල් මට්ටමේ විෂය සමගාමී වැඩසටහන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ED/09/02/01/01/020/ii හා 31/2024 දරන 'පාසල්වල විෂය සමගාමී කටයුතු සංවිධානය හා කළමනාකරණය' පිළිබඳ චක්‍රලේඛය අනුව පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි මහ පෙන්වීම අනුව කටයුතු කිරීමට වග බලා ගත යුතු වේ.

**හැඳින්වීම**

අධ්‍යාපනයත්, පාසලේ විෂය මාලාවත් වඩාත් වැඩි අවධානයට ලක්වෙමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නව රාජ්‍ය ප්‍රමුඛතා හා අනුගත වෙමින් පුළුල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට දැනටමත් කටයුතු කරමින් තිබේ. ඒ අනුව විධිමත් විෂය මාලාව මෙන්ම විෂය සමගාමී විෂය මාලාව වඩාත් අර්ථවත්, ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉගෙනුම් කුසලතා ප්‍රවර්ධනය කරන වැඩපිළිවෙළක් බවට පත් කළ යුතුව ඇත. ඒ අනුව පාසල් දරුවන් තුළ මානසික, ශාරීරික, චිත්තවේගී, සමාජීය, සංස්කෘතික හා චර්යාමය යන අංශ සංවර්ධනය වන පරිදි විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතු ය. තව ද නව යෞවනයේ දී ඇතිවන මූලික ආවේග මැඩපැවැත්වීමේ උපාය මාර්ගයක් ලෙස ද විෂය සමගාමී ක්‍රියාකාරකම් වැදගත් වේ. සිසුන්ගේ ලැදියා, කුසලතා අනුව මෙම විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීම ද වැදගත් වේ. සිසුන් විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම සහ ඔවුන්ගේ සාධන මට්ටම් ක්‍රමවත් පදනමක සිට නිරීක්ෂණය කළ යුතු ය.

විෂය සමගාමී වැඩසටහන්වල අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ගුරුවරුන්ගේ සහයෝගය ලබා ගත යුතු අතර, සෑම සිසුවෙකු ම හැකි පමණ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම කෙරෙහි උනන්දු කර විය යුතු ය.

පාසල් තුළ ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ විදුහල්පතිවරයා ධනාත්මක ආකල්පවලින් පරිපූර්ණ විය යුතු ය. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සහභාගිවන්නන්, සංවිධායකයන්, අභිප්‍රේරණය කිරීමේ වැදගත්කම මැනවින් වටහා ගෙන තිබිය යුතු ය. තවද සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳව ද දැඩි සේ සැලකිලිමත් විය යුතු ය. සිසුන් තුළ සැඟවී තිබෙන ආවේණික හැකියා විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් වර්ධනය කිරීම ද ගවේෂණාත්මක ව සිදු කළ යුතු ය.

පාසල් මට්ටමින් විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම මගින් පහත සඳහන් අරමුණු වලට ළඟාවීම අපේක්ෂා කෙරේ.

- සමබර පෞරුෂයකින් යුත් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් බිහි කිරීම.
- ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් තුළ තිබිය යුතු මෘදු කුසලතා සංවර්ධනය කිරීම.
- රටේ තිරසාර පැවැත්ම, ජාතියේ අනාගතය, මතු අභිමානය රඳා පවතින ශිෂ්‍ය පරපුර යහපත් කායික මානසික සෞඛ්‍ය රටාවකින් හා මනා පෞරුෂයකින් යුක්තව නිර්මාණය කිරීම.
- රැකියා වෙළඳපොළට ගැළපෙන නිපුණතා සහිත පුරවැසියන් නිර්මාණය කිරීම.
- ශ්‍රී ලාංකේය අනන්‍යතාව සහිත ගෝලීය පුරවැසියන් බිහි කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.

| | | |
|---|---|---|
| 01 | හැඳින්වීම | 1. විෂය සමගාමී ක්‍රියාකාරකම් අර්ථ දැක්වීම<br>2. සමස්ත සංවර්ධනයේ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම<br>3. විෂය සමගාමී විෂය මාලා වැඩසටහන්වල අරමුණු |
| 02 | විෂය සමගාමී ක්‍රියාකාරකම් වර්ග | 1. ක්‍රීඩා හා ශාරීරික ක්‍රියාකාරකම්<br>2. කලා හා සංස්කෘතික<br>3. සංගම් හා සමාජ<br>4. නායකත්වය හා සේවය<br>5. ශාස්ත්‍රීය දැනුම පොහොසත් කිරීමේ වැඩසටහන් |



CamScanner

| | | |
|---|---|---|
| 03 | විෂය සමගාමී වැඩසටහන් ව්‍යූහය | 1. වාර්ෂික දින දර්ශනය (අධ්‍යයන වර්ෂය පුරා ම වැඩසටහන්වල දළ සැලැස්ම)<br>2. සියලු ම දරුවන් ක්‍රියාකාරකම් සඳහා අන්තර්ගත කිරීම. (ක්‍රියාකාරකම් පරාසයක් ඇසුරෙන් දරුවන් යොමු කිරීම.)<br>3. අධ්‍යයන විෂය මාලාව සමග ඒකාබද්ධ කිරීම<br>4. නම්‍යශීලී බව (සිසුන්ගේ රුචිකත්වය හා අවශ්‍යතා මත ක්‍රියාකාරකම් තෝරා ගැනීම)<br>5. කාල කළමනාකරණය (ශාස්ත්‍රීය විෂය මාලාව සහ සමගාමී විෂය මාලාව මගින් අධ්‍යාපනය තුලනය කිරීම) |
| 04 | ගුරුවරුන් සහ පුහුණුකරුවන්ගේ කාර්යභාරය | 1. ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට අවස්ථාව දීම සහ සාධාරණ ව ඔවුන්ගේ දක්ෂතා හඳුනා ගැනීම.<br>2. මග පෙන්වීම හා උපදේශනය<br>3. නිපුණතා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම<br>4. අධීක්ෂණය සහ ඇගයීම |
| 05 | ශිෂ්‍ය සහභාගිත්වය හා වගකීම | 1. ස්වේච්ඡා සහභාගිත්වය<br>2. කැපවීම සහ පැමිණීම<br>3. සම වයසේ මිතුරන්ට හා උපදේශකයින්ට ගරු කිරීම<br>4. පාසල් ප්‍රජාවට දායක වීම<br>5. පෞද්ගලික සංවර්ධනය |
| 06 | සම්පත් සහ පහසුකම් | 1. විෂය මාලා ක්‍රියාකාරකම් සඳහා අයවැයක් වෙන් කිරීම<br>2. පහසුකම් සහ උපකරණ සඳහා නිත්‍යානුකූල ප්‍රවේශය<br>3. බාහිර සංවිධාන සමග සහයෝගීත්වය<br>4. සුදුසු ආරක්ෂක පියවර අනුගමනය කිරීම |
| 07 | පිළිගැනීම හා ත්‍යාග<br>(Recognition and Awards) | 1. ජයග්‍රහණය පිළිගැනීම<br>2. සම්මාන සහ සහතික<br>3. ශාස්ත්‍රීය අධ්‍යාපන කටයුතු සමග ඒකාබද්ධ වීම<br>4. සිසුන් ඇගයීමේ ධනාත්මක සංස්කෘතියක් නිර්මාණය කිරීම |
| 08 | දෙමාපියන් සහ ප්‍රජාව සමග සහයෝගීත්වය | 1. දෙමාපියන්ගේ සහභාගිත්වය හා සහයෝගීත්වය<br>2. ප්‍රජා සම්බන්ධවීම් අවස්ථා<br>3. ශිෂ්‍ය ජයග්‍රහණ පාසල තුළ ප්‍රදර්ශනය |
| 09 | තක්සේරු කිරීම හා ඇගයීම | 1. විෂය සටහන් ක්‍රියාකාරකම් තක්සේරු කිරීමේ නිර්ණායක<br>2. ශ්‍රේණිගත කිරීමේ හා වාර්තා කිරීමේ යාන්ත්‍රණය<br>3. ප්‍රතිපෝෂණ හා වැඩිදියුණු කිරීම් උපාය මාර්ග |
| 10 | අඛණ්ඩ වැඩිදියුණු කිරීම | 1. විෂය සමගාමී වැඩසටහන් සමාලෝචනය<br>2. සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන්ගේ ප්‍රතිපෝෂණය<br>3. වෙනස්වන ප්‍රවනතා සහ අවශ්‍යතාවලට අනුවර්තනය වීම |
| 11 | නිගමනය | 1. සමස්ත අධ්‍යාපනය සඳහා පාසලේ කැපවීම ශක්තිමත් කිරීම (පූර්ණ දරුවෙකු, පූර්ණ වැසියෙකු කිරීම).<br>2. ජීවිත කාලය පුරාම ඉගෙනීම සහ නිපුණතා සංවර්ධනය දිරිමත් කිරීම |

CamScanner

## පාසලක් තුළ ක්‍රියාත්මක කළහැකි පොදු ක්‍රියාකාරකම්

**විශේෂ උත්සව හා වැඩසටහන්**

- ක්‍රීඩා උත්සව
- කලා උළෙල
- ආගමික වැඩසටහන්
- වර්ණ රාත්‍රිය
- ශිෂ්‍ය නායක වැඩසටහන්
- විවිධ ප්‍රසංග
- පෝෂණ වැඩසටහන්
- සෞඛ්‍ය වැඩසටහන්
- පරිසර වැඩසටහන්
- ප්‍රථමාධාර වැඩසටහන්
- රැස්වීම්
- ශිෂ්‍ය සුබසාධන වැඩසටහන්
- බාහිර ආයතන විසින් දියත් කරනු ලබන වැඩසටහන් (උදා- මාධ්‍ය ප්‍රදීප වැනි)
- පුස්තකාලය
- ශ්‍රමදාන
- ජාතික හා ලෝක මට්ටමේ සැමරුම් වැඩසටහන් (අවුරුදු උළෙල/නිදහස් දිනය/ගුරු දිනය/දීපවාලී)

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

- සංගීත කණ්ඩායම්
- කවි සමාජ
- කෙටි කතා ලිවීම
- බිත්ති පුවත්පත්
- විවිධ ව්‍යාපෘති
- ලේඛක සංගම්
- ප්‍රදර්ශන
- දැනුම මිනුම තරඟ
- මාධ්‍ය කව
- Public Speaking
- අත්වැඩ හා අත්කම්
- චිත්‍ර හා මූර්ති
- නාට්‍ය කව
- ඉවුම් පිහුම් වැඩසටහන්
- ඡායාරූප සංගම්
- පුහුණු කඳවුරු
- පරිසර හට කණ්ඩායම්
- සාහිත්‍ය කව
- නැටුම්/ගැමි නාට්‍ය
- විකට හා අභිරූපණ වැඩසටහන්
- කියවීමේ තරඟ
- විනෝදාංශ කව
- මැහුම් ගෙතුම්
- සාමාන්‍ය දැනුම කව
- ළමුන්ට උපකාර කිරීම (Helping Kids)
- සංගීත කණ්ඩායම් (Singing Groups)
- යෝග අභ්‍යාස
- පෝස්ටර් නිර්මාණ
- පන්ති සභරා

මෙයට අමතරව පාසල තුළ ක්‍රියාත්මක වන සංගම් අනුව තවත් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඇතුළත් විය හැකි ය.



CamScanner

සංගම්

- සිංහල සාහිත්‍ය සංගම්
- සමුපකාර සමිති
- පුරාවිද්‍යා සමාජ
- තරුණ නිර්මාණකරුවන්ගේ සමාජ/නව නිපැයුම් සංසද
- විද්‍යා
- ගණිත
- ගෘහ නිර්මාණ
- තාරකා විද්‍යා
- ආර්ථික සංගම්
- ඉංග්‍රිසි සාහිත්‍ය සංගම්
- ඉලෙක්ට්‍රොනික තාක්ෂණ සංගම්
- ඉතිහාස සංගම්
- මනෝ විද්‍යා සමාජ
- රොබෝ තාක්ෂණ සමාජ
- කවි සමාජ
- වෙබ් නිර්මාණ සමාජ
- ලේඛක සංගම්
- ගුවන් සේවා සමාජ
- ව්‍යවසායකත්ව කව
- Home Economics Club
- Interact Club
- UNESCO
- කියවීමේ සමාජ
- සුපිළිපන්න සමාජ
- වෘත්තීය මාර්ගෝපදේශ සමාජ

<u>පාසල් තුළ ක්‍රියාත්මක වන,බාහිර ආයතන හා සම්බන්ධිත ප්‍රධාන විෂය සමගාමී ක්‍රියාකාරකම්</u>

- බාලදක්ෂ
- බාලදක්ෂිකා
- ශිෂ්‍යභට
- ශාන්ත ජෝන් ගිලන් රථ සේවය
- රතුකුරුස සංගමය
- සෞඛ්‍යදාන
- ජාතික යෞවණ තිළිණ වැඩසටහන
- පරිසර නියමු
- මාර්ග ආරක්ෂණ ජනාධිපති සම්මාන

## ප්‍රාථමික පාසල්වල/ ප්‍රාථමික අංශයේ ක්‍රියාත්මක කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම්

**පොදු විෂය සමගාමී ක්‍රියාකාරකම්**

- ක්‍රීඩා උත්සව
- ආගමික වැඩසටහන්
- ශිෂ්‍ය නායක වැඩසටහන්
- විවිධ ප්‍රසංග
- පෝෂණ වැඩසටහන්
- සෞඛ්‍ය වැඩසටහන්
- පරිසර වැඩසටහන්
- සරඹ සංදර්ශණ
- ප්‍රථමාධාර වැඩසටහන්
- රැස්වීම්
- ශිෂ්‍ය සුබසාධන වැඩසටහන්
- බාහිර ආයතන විසින් දියත් කරනු ලබන වැඩසටහන්
- පුස්තකාලය
- ශ්‍රමදාන
- ජාතික හා ලෝක මට්ටමේ සැමරුම් වැඩසටහන් (අවුරුදු උළෙල/නිදහස් දිනය/ගුරු දිනය/දීපවාලි)

**සංගම්**

- සිංහල සාහිත්‍ය
- ඉංග්‍රීසි සාහිත්‍ය
- නාට්‍ය /නර්තන
- සංගීත හා නැටුම් කණ්ඩායම්
- සුපිළිපන්න සමාජ
- අනාගත වැඩ ලෝකය දිනන්නෝ (Future Achievers Society)
- මූර්ති හා චිත්‍ර සමාජ
- විනෝදාත්මක ක්‍රීඩා සමාජ
- ඉගෙනුම් සමාජ
- බාලදක්ෂ/බාලදක්ෂිකා
- විනෝදාංශ සමාජ

## ශාස්ත්‍රීය කටයුතු හා සබැඳි විෂය සමගාමී ක්‍රියාකාරකම්

- කියවීමේ සමාජ
- බිත්ති පුවත්පත්
- කථා නිර්මාණ
- කවි /පද්‍ය නිර්මාණ
- පෝස්ටර් නිර්මාණ
- විවාද
- ප්‍රදර්ශන
- ඉංග්‍රීසි



CamScanner

## විනෝදාංශ සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම්

- මුද්දර සමාජ
- සාහිත්‍ය/නැටුම්
- ක්ෂේත්‍ර චාරිකා
- මූර්ති හා චිත්‍ර
- විනෝදාත්මක ක්‍රීඩා
- පුස්තකාල වැඩසටහන්/ පන්ති පුස්තකාලය

## සමාජීය සංවර්ධනය සඳහා වන විෂය සමගාමී ක්‍රියාකාරකම්

- බාලදක්ෂ/බාලදක්ෂිකා/සෞඛ්‍යදාන/ශිෂ්‍යභට ක්‍රියාකාරකම්
- කවි වැඩසටහන්
- නායකත්ව සංවර්ධන වැඩසටහන්
- විවිධ ආගමික හා ජාතීන් අතර සුහදතාව සංවර්ධනය කිරීමේ වැඩසටහන් (වෙසක්/නත්තල්/තෛපොංගල් වැනි)
- ක්ෂේත්‍ර චාරිකා
- ජාතික හා ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන්

## ශාරීරික කුසලතා සංවර්ධනය සඳහා වන විෂය සමගාමී ක්‍රියාකාරකම්

- ක්‍රීඩා (එළිමහන්/ක්‍රීඩාගාර තුළ)
- සරඹ සංදර්ශන
- ව්‍යායාම
- විනෝදාත්මක ක්‍රීඩා

## සංස්කෘතික කුසලතා සංවර්ධනය සඳහා වන විෂය සමගාමී ක්‍රියාකාරකම්

- ශ්‍රී ලාංකිය ආවේණික සංගීතය
- නැටුම්
- නාට්‍ය
- වෙනත් විවිධ සංස්කෘතික අංග
  - ✓ අලුත් අවුරුදු
  - ✓ තෛපොංගල්
  - ✓ දීපාවලී
  - ✓ රාමලාන්
  - ✓ නත්තල් ඇතුළු වෙනත් සංස්කෘතික අංග

**<u>පුරවැසිභාවය හා අගයයන් සංවර්ධනය සඳහා වන විෂය සමගාමී ක්‍රියාකාරකම්</u>**

- විවිධ වැඩමුළු හා කඳවුරු
- නායකත්ව කඳවුරු/වැඩසටහන්
- ප්‍රථමාධාර කඳවුරු හා වැඩසටහන්
- සුපිළිපන්න සමාජ

**<u>කලා සහ ශිල්ප සම්බන්ධිත විෂය සමගාමී ක්‍රියාකාරකම්</u>**

- මුද්දර සමාජ
- ඇල්බම් නිර්මාණ
- ඉවුම් පිහුම් වැඩසටහන්
- ඡායාරූප සංගම්
- මල් සැකසීම හා අත්කම් නිර්මාණ
- ක්ලේ ආකෘති සැකසීම
- කොලාජ් චිත්‍ර හා නිර්මාණ සැකසීම

## පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අදාළ නිශ්චිත උපදෙස් හා ක්‍රමවේද

**<u>වැඩසටහන් සඳහා අනුමැතිය/අවසරය ලබාගැනීම</u>**

පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී (විශේෂයෙන්ම බාහිර ආයතන හා සම්බන්ධිත) සිසුන්ගේ ආරක්ෂාව සම්බන්ධව බලවත් අවධානයක් යොමු කළ යුතු අතර, මේ සඳහා අදාළ අනුමැතිය නිසි පරිදි ලබා ගැනීම පාසලේ විදුහල්පතිවරයාගේ වගකීමක් වේ.

සියලු විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල්වල ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් අනුමැතිය ලබා ගැනීම සිදු කළ යුතු ය.

➢ අවසර ලබා ගැනීම (පාසල් මට්ටමින් පවත්වනු ලබන ක්‍රියාකාරකම් සඳහා)
- සමස්ත ලංකා මට්ටමෙන් පවත්වන සියලුම තරඟ
- ජම්බෝරි
- ශිෂ්‍ය කඳවුරු (ශිෂ්‍යභට/බාලදක්ෂ ආදි......)
- විදේශ ගතවීම්
- පාගමන්
- ප්‍රදර්ශන
- ශිෂ්‍ය නායක වැඩසටහන්
- ක්ෂේත්‍ර චාරිකා

➢ ක්‍රියාකාරකම අනුව අවසර ලබාගැනීමේ දී අවශ්‍ය වන තොරතුරු
- පාසල් සංගම් පිහිටුවීමේ දී අනුගමනය කළ යුතු සැලැස්ම *ඇමුණුම 01* මගින් දක්වා ඇත.
- විෂය සමගාමී ක්‍රියාකාරකම්/වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන *ඇමුණුම 02* මගින් දක්වා ඇත.
- විදේශ සංචාරයන් සඳහා සිසුන්/ගුරුවරුන්/නිලධාරීන් සහභාගි කරවීමේ දී මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන *ඇමුණුම 03* මගින් දක්වා ඇත.



CamScanner

**විෂය සමගාමී වැඩසටහන් පාසල් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පොදු උපදෙස්**

1. පාසල තුළ ක්‍රියාත්මක සෑම විෂය සමගාමී ක්‍රියාකාරකමක්ම විදුහල්පතිගේ පූර්ණ අධීක්ෂණයට ලක් කළ යුතු ය.
2. විෂය සමගාමී ක්‍රියාකාරකම් භාරව නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙක් පත් කළ යුතු ය.
3. සියලු ම පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සිසුන් සහභාගි කළ යුතු වන්නේ තවත් එක් ක්‍රියාකාරකමක් පමණක් වශයෙන් නොව සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය හා යහපත් පුරවැසියෙක් සමාජයට දායාද කිරීමේ මුඛ්‍ය අරමුණ පෙරදැරි කරගෙන විය යුතු ය.
4. සෑම සිසු සිසුවියක්ම අවම වශයෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකකටවත් සහභාගි විය යුතු ය. (සංගම් වලට අමතරව)
5. සෑම ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන්ම සංවිධාන ව්‍යූහ සටහනක් පවත්වාගෙන යා යුතු ය.
6. පාසල තුළ ක්‍රියාත්මක වන සියලුම විෂය සමගාමී ක්‍රියාකාරකම් වාර්ෂික දින දර්ශනයට/වාර්ෂික සැලැස්මට ඇතුළත් කළ යුතු ය.
7. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ වන ගුරුභවතුන්ගේ හැකියාව හා උනන්දුව අනුව ඔවුන් විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාශීලීව සම්බන්ධ කර ගත යුතු ය.
8. පාසල් සංවර්ධන සමිතිය, ආදි ශිෂ්‍ය සංගමය වැනි සංගම්වල සහයෝගය හා උපකාර ලබා ගැනීමේ දී එම උපකාර හා සහයෝගවල වැදගත්කම හා අභිමතාර්ථ පැහැදිලි කර ගත යුතු ය.
9. ගුරුවරුන් හා විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ වන සියලු දෙනාගේ සංවිධාන කුසලතා සංවර්ධනය කිරීම සඳහා කටයුතු කළ යුතු ය.
10. පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා දායකත්වය ලබා දෙන ගුරුවරුන් පාසල තුළ නිසි ඇගයීමකට ලක් කළ යුතු ය.
11. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සිසුන් සහභාගි වීමේ දී මගහැරෙන අධ්‍යාපන කටයුතු ආවරණය කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් පාසල සතු විය යුතු ය.

**බාහිර ආයතන මගින් පාසල් තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳව ප්‍රමුඛ අවධානය යොමු කළ යුතු ය.**

1. බාහිර ආයතනවලින් පවත්වන වැඩසටහන් සඳහා සිසුන් සහභාගි කරවීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් හා අවශ්‍යතාව අනුව අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් අවසරය ලබාගත යුතු ය.
2. සියලු බාහිර ආයතන සම්බන්ධීකරණය සඳහා වෙන් වෙන් වශයෙන් ගුරුවරුන් පත් කළ යුතු ය.
3. මෙම සෑම විෂය සමගාමී ක්‍රියාකාරකමක් ම සම්බන්ධව වාර්ෂික සැලැස්මක් සකස් කළ යුතු ය.
4. මෙම සියලු ක්‍රියාකාරකම් පාසලේ වාර්ෂික දින දර්ශනයට ඇතුළත් කළ යුතු ය.
5. ක්‍රියාත්මක වන වයස් කාණ්ඩ අනුව යාවත්කාලීන ශිෂ්‍ය නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ අදාළ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගත් කිසිදු වැඩසටහනක් සඳහා සිසුන් සහභාගි නොකළ යුතුය (ජම්බෝරි, පුහුණු කඳවුරු, විදේශ වැඩසටහන් ආදි ...)
7. මෙම විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට අදාළ ව ජම්බෝරි, පුහුණු කඳවුරු, විදේශ වැඩසටහන් ආදිය සඳහා සිසුන් සහභාගි කරවීමේ දී දෙමාපියන්ගේ පූර්ණ අවසරය ලිඛිතව ලබා ගත යුතු ය.
8. මෙම ක්‍රියාකාරකම් සඳහා සිසුන්ගෙන් පෞද්ගලික ව මුදල් එකතු නොකළ යුතු ය.
9. සිසුන්ගේ රුචිකත්වය අනුව මෙම ක්‍රියාකාරකම් සඳහා සහභාගි වීමට අවස්ථා සම්පාදනය කළ යුතු ය.



CamScanner

10. මෙම විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට අදාළව පවත්වන ගුරු පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට ගුරුවරුන් සඳහා අවශ්‍ය ඉඩ ප්‍රස්තා සලසා දිය යුතු ය.
11. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලින් අධ්‍යාපන ක්ෂේත්‍රයට එක්වන ගුරුවරුන් මෙම විෂය සමගාමී ක්‍රියාකාරකම් සම්බන්ධව පුහුණුවක් ලබා ඇති බැවින් පාසලේ සිටින එම ගුරුවරුන් මෙම වැඩසටහන් සඳහා අනිවාර්යයෙන් සහභාගි කර ගත යුතු ය.

**විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල් තුළ ක්‍රියාත්මක කිරීමේ දී පවත්වාගත යුතු ලේඛන**

- පාසල් වාර්ෂික ලිතට සම්බන්ධ විෂය සමගාමී ලිත
- එක් එක් විෂය සමගාමී ක්‍රියාකාරකම සඳහා සඳහා වන සැලැස්ම
- විෂය සමගාමී කටයුතු වගකීම් පැවරී ඇති ගුරුවරුන්ගේ නාම ලේඛනය
- පාසල තුළ පවත්වාගෙන යන ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතු පිළිබඳ නාමලේඛනය
- විෂය සමගාමී චක්‍රලේඛ ගොනුව
- විෂය සමගාමී සම්පත්දායක හා පුහුණුකරුවන්ගේ නාම ලේඛනය
- ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතු අයවැය ලේඛනය
- සහභාගි වන ශිෂ්‍ය නාම ලේඛනය
- එක් එක් සතිය තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කාලසටහන

**විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල් තුළ ක්‍රියාත්මක කිරීමේ දී පවත්වා ගත යුතු වාර්තා**

- දෛනික තැපැලෙන් ලැබෙන විෂය සමගාමී කටයුතු සම්බන්ධ ලිපි බෙදා හැරීමේ ලේඛනය
- වාර්ෂික සැලැස්මට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධ වාර්තා
- විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ගුරුවරුන්ගේ, පුහුණුකරුවන්ගේ හා සිසුන්ගේ පැමිණීම සම්බන්ධ නාම ලේඛන
- විෂය සමගාමී ක්‍රියාකාරකම් අධීක්ෂණ වාර්තා
- ජයග්‍රහණ වාර්තා
- ජයග්‍රහණ සම්බන්ධ සහතිකපත්‍ර බෙදාදීම හා ඇගයීම් සිදු කිරීම සම්බන්ධ වාර්තා
- විෂය සමගාමී තත්ත්ව කව වාර්තා
- අධ්‍යාපන චාරිකා සම්බන්ධ තොරතුරු හා ලිපිගොනු
- විෂය සමගාමී කටයුතු සඳහා ගුරුවරුන් වෙත වගකීම් පැවරීම සම්බන්ධ ව විදුහල්පති විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාව
- ප්‍රාථමික අංශයේ විෂය සමගාමී ක්‍රියාකාරකම් තොරතුරු ගොනුව
- පාසල් කාලය තුළ විෂය සමගාමී කටයුතු සඳහා පාසලෙන් බැහැර වන ගුරුවරුන්ගේ හා සිසුන්ගේ නාම ලේඛන
- පුහුණුකරුවන්ගේ පැමිණීම හා පිටවීම අත්සන් ලේඛන
- විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සහභාගි වන සිසුන් හට මගහැරෙන විෂය නිර්දේශ ආවරණය සඳහා පවත්වන අමතර අධ්‍යාපන වැඩසටහන් පිළිබඳ තොරතුරු
- "අපේ පාසල කෙතරම් ගුණාත්මක ද" යන ඇගයීම් ක්‍රියාවලියට අදාළ විෂය සමගාමී ක්‍රියාකාරකම් පොත
- සෑම සිසුවෙකු සඳහාම පෞද්ගලික වන සේ විෂය සමගාමී ක්‍රියාකාරකම් වාර්තා පොතක් පවත්වාගෙන යාම (ශිෂ්‍ය වාර්තා පොත ද මේ අනුව පවත්වාගෙන යා හැකි ය.)



CamScanner

## පාසල් සංගම් පිහිටුවීමේදී අනුගමනය කළයුතු සැලැස්ම

පාසල තුළ යම් සංගමයක් ආරම්භ කරන්නේ නම් පහත කරුණු අනුව යෝජනාව සකස් කර විදුහල්පතිගෙන් ඒ සඳහා අවසරය ලබාගත යුතු යි.

1. සංගමයේ නම -
2. හැඳින්වීම-
3. සංගමය ආරම්භ කිරීමට අවශ්‍යතාවය-
4. පරමාර්ථ-
5. අරමුණු-
6. උපදේශකත්වය හා මගපෙන්වීම-
7. සාමාජිකත්වය-
    I. සුදුසුකම්-
    II. නව බඳවා ගැනීම්-
8. රැස්වීම් පැවැත්වීම-
    I. කාරක සභා-
    ii. වාර්ෂික මහසභා රැස්වීම-
9. නිල දරන්නන්-
10. නිලධාරී කාර්ය භාරය-
11. යෝජිත ක්‍රියාකාරකම් හා ඒවා ක්‍රියාත්මක කිරීම-
12. ව්‍යාපෘති සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම-

CamScanner

**විෂය සමගාමී මාර්ගෝපදේශ, උපදේශන ශාඛාව**
**විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය**

**පාසලේ නම:-** ..........................................................................................................

**සම්බන්ධවන බාහිර ආයතනය :-**.......................................................................................

**වැඩසටහන :-** ..........................................................................................................

**වැඩසටහන පවත්වන දිනය :-** ..........................................................................................

**අනුමැතිය සඳහා ලිපිය ලැබුන දිනය :-**..............................................................................

**<u>විෂය සමගාමී ක්‍රියාකාරකම්/වැඩසටහන් සඳහා මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා විෂය සමගාමී ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන.</u>**

සටහන - ඒ ඒ වැඩසටහන් සඳහා මෙම පිරික්සුම් පත්‍රිකාව සුදුසු හා උචිත අන්දමින් භාවිත කළ යුතුය.

1 වැඩසටහන පිළිබඳ අංග සම්පූර්ණ ව්‍යාපෘති වර්තාවක් (ව්‍යාපෘති වාර්තාවේ ඇතුලත් කළ යුතු අංග වෙනම සඳහන් කළ යුතුය). අදාළ පරිදි ඉදිරිපත් කර ඇත. ☐
- 1.1 වැඩසටහන පැවැත්වෙන ස්ථානය හා දිනයන් නිවැරදිව සඳහන් කර ඇත. ☐
- 1.2 විදුහල්පති අනුමැතිය හා නිර්දේශ ඉදිරිපත් කර ඇත. ☐
- 1.3 සහභාගි කරනු ලබන සියලුම දරුවන් සඳහා දෙමාපියන්ගේ අවසරය ලබාගත් බව විදුහල්පති විසින් සනාථ කර ඇත.(සිසුන් සහභාගි වන්නේ නම්) ☐
- 1.4 විදුහල්පති විසින් අනුමත කළ සහභාගීවන සිසුන්ගේ නාම ලේඛණය ඉදිරිපත් කර ඇත. ☐
- 1.5 සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාව අවශ්‍ය වන්නේ නම්, වලංගු වෛද්‍ය වාර්තා (මාස 3ක් ඇතුලත ලබා ගත්) ඉදිරිපත් කර ඇත. ☐
- 1.6 සිසුන් භාරව කටයුතු කරන ගුරු මහත්ම මහත්මීන්ගේ සියලු විස්තර ඉදිරිපත් කර ඇත. ☐
- 1.7 ආරාධිත පාසල් සහභාගීවන්නේ නම් එම පාසල් නාම ලේඛණය ඉදිරිපත් කර ඇත. ☐
- 1.8 පාසල් වාර්ෂික සැලැස්මට ඇතුලත් වැඩසටහනක් බව. ☐

2 වැඩසටහන් වල අනුමත වැය ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත. ☐
- 2.1 වැඩසටහන සඳහා ප්‍රතිපාදන සපයා ගන්නා ක්‍රමවේද ඉදිරිපත් කර ඇත. ☐
- 2.2 අවශ්‍ය පරිදි ප්‍රසම්පාදන අනුමැතිය හා පළාත්/කලාප අනුමැතිය ලබාගෙන ඇත. ☐
- 2.3 කිසිදු අයුරකින් පාසල් සිසුන්ගෙන් මුදල් අයකර නොගන්නා බවට ලේඛන ඉදිරිපත් කර ඇත. ☐

3 බාහිර ආයතනයක් සමග ගිවිසුමක් සහිතව සිදු කෙරෙන වැඩසටහනකදී එහි විධිවිධානවලට අනුකූල බව සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කර ඇත.(එම ලිපිය බාහිර ආයතනයෙන් ඉදිරිපත් කර ඇත) ☐

4 පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන්හි කාල සටහන් සමග වැඩසටහන් සාරාංශයක් ඉදිරිපත් කර ඇත. ☐

5 වැඩසටහන සඳහා සහභාගිවන නිලධාරීන් /දේශකයින්/සම්පත්දායකයින් පිළිබඳ සියලු විස්තර (එම නිලධාරීන්ගේ සුදුසුකම් සහිතව) ඉදිරිපත් කර ඇත. ☐

6 ළමුන් ඇතුළු සහභාගිවන්නන් සියලු දෙනාගේ ආරක්ෂාව තහවුරු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග පැහැදිලිව සඳහන් කර ඇත.(අදාල අංශවලින් ලබාගත් තහවුරු කිරීම් ලිපි සමග) ☐

7 වැඩසටහනට සහභාගිවන්නන් සඳහා අවශ්‍ය ආහාර, නේවාසික පහසුකම්,වෛද්‍ය පහසුකම්,අනෙකුත් සනීපාරක්ෂක පහසුකම් සපයා ගැනීම පිළිබඳ අදාල අංශවල තහවුරු කිරීමේ ලිපි සමග ඉදිරිපත් කර ඇත. ☐

8 සිසුන් සහ සහභාගිවන්නන් සඳහා නේවාසික පහසුකම් සැපයීම සම්බන්ධ සියලු විස්තර ඉදිරිපත් කර ඇත. ☐

9 සිසුන්ගේ ප්‍රවාහන පහසුකම් සැපයීම පිළිබඳ ව විස්තර ඉදිරිපත් කර ඇත. ☐

10 කඳවුරු ගත ක්‍රියාකාරකම්/පා ගමන් සඳහා හෙදියන් සහ ප්‍රථමාධාර පහසුකම් සහිත ගිලන් රථයක් සපයා ගැනීමේ ලේඛන ඉදිරිපත් කර ඇත. ☐

11 ක්ෂේත්‍ර චාරිකා සඳහා යොදා ගන්නා වාහාන බලපත්‍ර සහ රියදුරන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. ☐

12 කඳවුරු /පා ගමන පැවැත්වෙන ස්ථානයේ දළ සැලැස්ම/ගමන් ගන්නා මාර්ගය පැහැදිලිව සඳහන් කර ඇත. ☐

CS CamScanner

ඇමුණුම 03

**විෂය සමගාමී මාර්ගෝපදේශ, උපදේශන ශාඛාව**
**විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන අංශය, අධ්‍යාපන අමාත්‍යාංශ**

**විදේශ සංචාරය සංවිධානය කරන ආයතනය :-......................................................................**
**වැඩසටහන :-......................................................................................................**
**විදේශ සංචාරය නිරත රට :-......................................................................................**
**විදේශ සංචාරය සිදු කරන කාලය :-..............................................................................**
**විදේශ සංචාරය අනුමැතිය සඳහා ලිපිය ලැබුන දිනය :-......................................................**

**විදේශ සංචාරයන් සඳහා සිසුන් හා නිලධාරීන් සහභාගී කරවීමේදී මූලික අනුමැතිය/නිර්දේශ ලබා ගැනීම සඳහා විෂය සමගාමී ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන.**

1. ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම පිළිබඳව නිර්දේශ හා අනුමැතීන් සහිත විස්තරාත්මක ලිපිය. ☐
2. විදේශ ආරාධනා ලිපිය. ☐
3. සංචාරය සඳහා පාසල් සිසුන් තෝරාගන්නා විධිමත් ක්‍රමවේදය පිළිබඳ වාර්තාව. ☐
4. වැඩසටහන් විස්තරය (සංචාරය සඳහා යන කාලසීමාව තුළ) ☐
5. සංචාරය මගින් සිසුන්ගේ අධ්‍යාපනයට පාසල් සිසුන්ට අත්වන ප්‍රතිලාභ පිළිබඳ වාර්තාව. ☐
6. තෝරාගත් පාසල් සිසුන්ට සහ ගුරුභවතුන්ට සංචාරය සඳහා සහභාගීවීමට විදුහල්පති විසින් අවසර ලබාදුන් ලිපියේ මුල් පිටපත විදුහල්පති නිර්දේශය ද සහිතව (අධ්‍යාපන ලේකම් වෙත) ☐
7. වැඩසටහනට සහභාගීවීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්වන දිනය හා වැඩසටහන නිමවා ශ්‍රී ලංකාවට පැමිණෙන දිනය අතර ඇති රාජකාරී නොයෙදෙන දිනයන් කොපමණ ද යන්න හා එසේ අමතර දිනයන් යොදා ගැනීමට හේතු. ☐
8. එම සිසුන් සංචාරයට සහභාගීවීමට දෙමාපිය කැමැත්ත හා අවසරය ලබාදුන් ලිපිවල මුල් පිටපත විදුහල්පති නිර්දේශ සහිතව (මව සහ පියා දෙදෙනාගේම අත්සන් සහිතව) ☐
9. සහභාගීවන පාසල් සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාව පිළිබඳ රජයේ රෝහලක වෛද්‍යවරයකු විසින් ලබාදුන් වෛද්‍ය වාර්තාවේ මුල් පිටපත විදුහල්පති නිර්දේශ සහිතවලිපි (අධ්‍යාපන ලේකම් වෙත) ☐
10. පාසල් සිසුන්ගේ භාරකාරිත්වය දරණ නිලධාරියා පිළිබඳ විස්තර (ඔවුන්ගේ රාජකාරි ආවරණය කිරීම සම්බන්ධව ආයතන ප්‍රධානී විසින් අනුමත කරන ලද ලිපි (අධ්‍යාපන ලේකම් වෙත) ☐
11. අදාල ගුරුභවතාගේ / නිලධාරියාගේ විදේශ ගමන් බලපත්‍රයේ සහ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපත්. ☐
12. සංචාරය වෙනුවෙන් සහභාගී වන්නන් සඳහා වෛද්‍ය පහසුකම් ආවරණය වන පරිදි දෙන ලද රක්ෂණ ආවරණය පිළිබඳ විස්තර (සංචාරයට සහභාගීවන ගුරුවරුන් සහ සිසුන් සඳහා) ☐
13. වයස අවුරුදු 16 සම්පූර්ණ කරන ශිෂ්‍ය,ශිෂ්‍යාවන් තම ජාතික හැඳුනුම්පතේ පිටපතක් හා වයස අවු 16 සම්පූර්ණ නොවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම පාසලේ විදුහල්පති විසින් සහතික කරන ලද 2'X 2' ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතුය. ☐
14. විදුහල්පති විසින් සහතික කරන ලද ගුවන් ගමන් බලපත්‍රවල පිටපත්. ☐
15. විදේශ චාරිකාව සඳහා සහභාගීවන නිලධාරීන් වියදම් සොයාගන්නා ආකාරය (සාක්ෂි ලිපි, අනුග්‍රහය ලැබෙන ආකාරය) ☐
16. ගුවන් ගමන් කාලසටහන. ☐
17. සිසුන්ගේ භාරකාරිත්වය දරමින් සහභාගීවන ගුරු මහතා/මහත්මියට විනය පරීක්ෂණ නොමැති බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිත ලිපිය. ☐
18. ගුරු භවතකු නොවන අවස්ථාවක සිසුන් භාරව යන නිලධාරියාගේ වෘත්තීය අනන්‍යතාව තහවුරු වන ලිපි ලේඛන (සංචාරයට සම්බන්ධවන ආකාරය). ☐
19. සහභාගීවන ශිෂ්‍ය සංඛ්‍යාවට ගැලපෙන අයුරින් ගුරුවරුන් සහභාගී කළ යුතුය (චක්‍රලේඛයට අනුව) ☐

CamScanner